සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 62 S

# පුරවැසි අධ්‍යාපනය I- II

කාලය පැය තුනයි

**සැලකිය යුතුයි.**
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ලොව පවත්නා පාලන ක්‍රම අතරින් වඩාත් මානව හිතවාදී පාලන ක්‍රමය වන්නේ,
1) රාජාණ්ඩු පාලනය 2) සමූහාණ්ඩු පාලනය 3) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය 4) ඒකාධිපති පාලනය

02. ''ප්‍රජාතන්ත්‍රවාදය'' යන සංකල්පයෙන් ගම්‍ය වන ප්‍රධාන බලය වන්නේ,
1) දේශපාලනික බලය යි. 2) ජනතා බලය යි. 3) සංස්කෘතික බලය යි. 4) ආගමික බලය යි.

03. සර්වජන ඡන්ද බලය මගින් පිළිගැනීමට ලක් වන්නේ,
1) සුළුතරයේ කැමැත්තය 2) ජනතා නියෝජිතයන්ගේ කැමැත්තය
3) ව්‍යවස්ථාදායකයේ කැමැත්තය 4) බහුතරයේ කැමැත්තය

04. 1978 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලංකාවේ " පරමාධිපත්‍ය බලය" ක්‍රියාත්මක වන ආකාරය විස්තර කර ඇත. මෙහි සඳහන් "පරමාධිපත්‍ය බලයේ" හිමිකාරීත්වය ඇත්තේ,
1) ජනතාවට ය. 2) ව්‍යවස්ථාදායකයට ය.
3. විධායකයට ය. 4) අධිකරණයට ය.

05. තම රටවල ප්‍රාදේශීය, වාර්ගික හා සංස්කෘතික විවිධ පාලන කාර්යයේ දී ඒකාබද්ධ කර ගැනීම සඳහා රටවල් අනුගමනය කරන ක්‍රියාමාර්ගවල ප්‍රධාන ස්වරූප දෙක වන්නේ,
1) බලය පෙන්වීම හා බලය ලබා ගැනීම. 2) බල පෙරළිය හා බලය සංධානගත කිරීම.
3) බලය විභේදනය හා බලය විමධ්‍යගත කිරීම. 4) බලය විමධ්‍යගතකරණය හා බලය බෙදා හැරීම.

06. ශ්‍රී ලංකාවේ නිදහසින් පසු යුගය තුළ බලය විමධ්‍යගත කිරීම සඳහා ගත් උත්සාහයන් කිහිපයක් පහත දැක්වෙන අතර ඒ අතරින් වර්තමානයේ දී ක්‍රියාත්මක වන පාලන ඒකකය වන්නේ,
1) දිස්ත්‍රික් සංවර්ධන සභා 2) ප්‍රාදේශීය මණ්ඩල 3) ප්‍රාදේශීය සභා 4) ග්‍රාමෝදය මණ්ඩල

07. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතන ලෙස හැඳින්වෙන්නේ,
1) පළාත් සභාව 2) මහ සභාව 3) ප්‍රාදේශීය සභාව 4) නගර සභාව

08. ඇමරිකා එක්සත් ජනපදයේ හා ස්විස්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන ආකාරය අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,
1) කොංගස් මණ්ඩලය - සන්ධීය මහා මණ්ඩලය 2) ජාතික සභාව - රාජ්‍ය සභාව
3) නියෝජ්‍ය මන්ත්‍රී මණ්ඩලය - සෙනෙට් සභාව 4) සන්ධීය මහා මණ්ඩලය - කොංගස් මණ්ඩලය

09. පහත දක්වා ඇත්තේ සංස්කෘතිය පිළිබඳව ඇති විද්වතුන් දෙදෙනෙකුගේ නිර්වචන වලින් උපුටා ගත් අදහස් දෙකකි. එම අදහස් ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනාගේ නම් පිළිවෙලින් සඳහන්කර ඇති පිළිතුර වන්නේ,
A - " පුද්ගලයෙකු විසින් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය යි"
B - " සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකොට ගන්නා මූ චර්යා රටාවන්ගේ සාමුහික නාමය සංස්කෘතිය යි"
1) E.T. හීලර් - E.B. ටයිලර් 2) E.B. ටයිලර් - චාර්ල්ස් A . එල්වුඩ්
3) A.V. ඩයිසි - C.F. ස්ට්‍රෝන්ග් 4) E.T. හීලර් - A.V. ඩයිසි

10. ශ්‍රී ලාංකික බහු සංස්කෘතික ජන සමාජයේ සාර්ථක පාලනයකට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය හැඳින්වීමට භාවිතා වන සංකල්පය වන්නේ,
1) යහජීවනය 2) සහජීවනය 3) යහපාලනය 4) සමෝධානය

11. නූතන ජාතික රාජ්‍ය සංකල්පයට අනුව රාජ්‍යයක් යනු,
   1) විවිධ ජාතීන්ට අනුව විවිධ වූවකි.    2) එක් ජාතියකි.
   3) එක් එක් සංස්කෘතියට වෙනස් වූවකි.    4) එක් ආගමකි.

12. ''වෙනස්කම් තුළින් එකමුතු බව'' යන තේමා තුළින් ආර්ථික සමාජීය හා දේශපාලන ක්‍රියාවලිය තුළ බහු සංස්කෘතිකභාවය මැනවින් ප්‍රයෝජනයට ගත් ආදර්ශමත් සංවර්ධිත රටවල් දෙක වන්නේ,
   1) ජපානය හා චීනය    2) ලංකාව හා ඉන්දියාව    3) සිංගප්පූරුව හා ස්විට්සර්ලන්තය    4) ඉතාලිය හා ප්‍රංශය

13. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීමට යාමේදී සෑම රාජ්‍යකටම විවිධ ප්‍රශ්න වලට මුහුණ පෑමට සිදු වේ. එසේ මුහුණපාන ප්‍රශ්න අතරින් වැදගත්ම හා මූලිකම සාධක දෙකක් වන්නේ,
   1) බුද්ධිමත්බව - උගත්බව    2) විරුකියාව - සුබසාධනය
   3) සැලසුම්කරණය - සංවිධානය    4) හිඟකම - මූලික ආර්ථික ප්‍රශ්න

14. රටක ආර්ථිකයක නිපදවන භාණ්ඩ වර්ගීකරණයට අනුව ආහාර ද්‍රව්‍ය, දැව, වාහන යන ඒවා අයත් වන භාණ්ඩ වර්ග අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,
   1) ආයෝජන භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ    2) අන්තර් භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ
   3) පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ    4) අයෝජන භාණ්ඩ. අන්තර් භාණ්ඩ, පාරිභෝජන භාණ්ඩ

15.අර්ථක්‍රම පිළිබඳව අවධානය යොමු කළ විට මධ්‍යගත සැලසුම් ආර්ථික ඇති රටවල් ලෙස හඳුන්වන්නේ,
   1) ධනවාදී අර්ථ ක්‍රමයක් පවතින රටවල් ය.    2) සමාජවාදී අර්ථ ක්‍රමයක් පවතින රටවල් ය.
   3) මිශ්‍ර අර්ථ ක්‍රමයක් පවතින රටවල් ය.    4) වෙළෙඳපොළ ආර්ථිකය සහිත රටවල් ය.

16. ජාත්‍යන්තර ආර්ථික සංවර්ධනය සමඟ යාමට ශ්‍රී ලංකාව සිය ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රබල වෙනසක් ඇති කිරීම පැහැදිලිව දැකිය හැකි වන්නේ කවර වර්ෂයකින් පසුව ද?
   1) 1977 වර්ෂයෙන් පසුව ය.    2) 2005 වර්ෂයෙන් පසුව ය.    3) 2009 වර්ෂයෙන් පසුව ය.    4) 2014 වර්ෂයෙන් පසුව ය.

17.ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම අතරින් දෙපාර්ශවයටම ''ජය - ජය'' විසඳුම ලබා ගැනීම සඳහා යොදා ගත හැකි සාර්ථක ක්‍රමවේදය වන්නේ,
   1) සහමන්ත්‍රණයයි    2) සාකච්ඡා ක්‍රමයයි    3) මැදිහත්කරණයයි    4) කේවල් ක්‍රමයයි

18) අන්තර්ජාතික ගැටුම් ප්‍රධාන කොටස් දෙකක් යටතේ දැක්විය හැකි අතර ඒවා නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
   1) වාර්ගික ගැටුම් - දේශපාලනික ගැටුම්    2) දේශපාලන ගැටුම් - සංස්කෘතික ගැටුම
   3) මතවාදී ගැටුම් - යුධමය ගැටුම්    4) ආගමික ගැටුම් - වාර්ගික ගැටුම්

19. සමථකරණය සඳහා පවතින නීත්‍යානුකූල ආයතනය වන්නේ,
   1) විධායක සභාව    2) අධිකරණය    3) කොමිසන් සභාව    4) සමථ මණ්ඩලය

20. සාමකාමීව ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු විසින් වර්ධන කරගත යුතු සමාජීය ගුණාංගයක් වන්නේ,
   1) දරාගැනීමේ ශක්තිය    2) ඉවසීම    3) අන්මත ගරු කිරීම    4) කරුණාව

21. සමාජයක් තුළ යුක්තිය, සාමය හා සුරක්ෂිතභාවය යන ලක්ෂණ මැනවින් දක්නට ලැබීම තුළින් පැහැදිලි වන්නේ, එම රට තුළ සාර්ථකව ක්‍රියාත්මක වන,
   1) දේශපාලන බල අධිකාරියයි    2) නීතියේ ආධිපත්‍යයි
   3) ස්වාධිපති බලයයි    4) ජනතා පරමාධිපත්‍ය බලයයි

22. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය හා මූලික නීතිය අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,
   1) රෝම ලන්දේසි නීතිය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය    2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය - උඩරට නීතිය
   3) රෝම ලන්දේසි නීතිය - තේසවලාමේ නීතිය    4) උඩරට නීතිය - තේසවලාමේ නීතිය

23. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඉහළම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව එංගලන්තයේ රාජාධිකරණය වෙත අභියාචනා කිරීමේ බලය අහෝසි කිරීම බලාත්මක වූයේ,
   1) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ය    2) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ය
   3) 1973 යුක්තිය පසිඳලීමේ පනත මගින්ය    4) 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිසම මගින්ය

24. • ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන තනතුරකි.
   • වැටුප ඒකාබද්ධ අරමුදලෙන් ගෙවන අතර එය අඩු කළ නොහැකිය.
   • 1994 න් පසු ලාංකික ඕනෑම පුරවැසියෙකුට ම සිය පැමිණිල්ල සෘජුව මොහුට ඉදිරිපත් කළ හැකිය.
   ඉහත සඳහන් ප්‍රකාශ තුන මගින් කියවෙන ආරවුල් විසඳීම සම්බන්ධයෙන් වැදගත් වන නිලධාරියා නම්,
   1) නීතිපතිතුමා    2) අධිකරණ අමාත්‍යතුමා    3) ඔම්බුඩ්ස්මන්වරයා    4) අග්‍ර විනිශ්චයකාරතුමා

25. ජී. මාර්ෂල් නමැති විද්වතා විසින් දක්වා ඇති නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග අතරට අයත් නොවන කාරණය වන්නේ,
   1) සෑම කෙනෙකුටම රටේ නීතියට යටත් විය යුතු වීම.
   2) ස්වාධීන අධිකරණයක් මගින් නීතිය ක්‍රියාත්මක කිරීම.
   3) අපක්ෂපාතී, නිශ්චිත, සාධාරණ හා යුක්ති සහගත පොදු නීති පද්ධතියක් තිබීම.
   4) මානව හිමිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

26. අතීතයේ දී ද මධ්‍යම පාලනය හැරුණු විට රජුගේ පාලන කටයුතුවල සහායට ප්‍රාදේශීය ඒකක සැකසී තිබිණි. ඒ අනුව අනුරාධපුර යුගයේ අග භාගය වන විට දක්නට ලැබුණු පාලන ඒකක දෙකක් වන්නේ,
1) උත්තර පස්ස - ප්‍රාචීන පස්ස
2) දොළොස් දහස් රට - අට දහස් රට
3) රුහුණු රට - මලය රට
4) දිසාව - කෝරළ

27. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ස්වාධීන පාලනයකට ඉඩකඩ නොලැබෙන පරිදි 1833, 1910, 1921, 1924 යන වර්ෂවල සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලද්දේ,
1) ශ්‍රී ලාංකිකයන් ය.
2) බ්‍රිතාන්‍යයන් ය.
3) ලන්දේසීන් ය.
4) පෘතුගීසීන් ය.

28. මූලික අයිතිවාසිකම් හඳුන්වා දීම හා ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම සිදුකරන ලද්දේ කවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් ද?
1) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ය.
2) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ය.
3) 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණ මගින් ය.
4) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් ය.

29. ''සම්පත් බෙදී යාමේ විෂමතා නිසා සමහර ප්‍රාදේශීය ඒකකවලට වාසිත්, ඇතැම් ප්‍රාදේශීය සභාවලට අවාසිත් සිදු වීම යන්න අපට හැඳින්විය හැකි වන්නේ කවර ක්‍රියාවලියක් තුළින් මතුවන ගැටලුවක් ලෙස ද?
1) යටත්විජිතකරණය
2) බලය විමධ්‍යගතකරණය
3) බලය බෙදා හැරීම
4) ගෝලීයකරණය

30. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව නමින් හැඳින්වූ අතර, එම පාර්ලිමේන්තුව නියෝජනය කරන සමස්ත මන්ත්‍රීවරුන් සංඛ්‍යාව නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
1) මහජන ඡන්දයෙන් තේරී පත් වන මන්ත්‍රීන් 296 හා ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වන මන්ත්‍රීන් 29 කි.
2) මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රීන් 29 ක් හා ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වන මන්ත්‍රීන් 196 කි.
3) මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රීන් 196 ක් හා ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වන මන්ත්‍රීන් 29 කි.
4) මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රීන් 225 හා ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වන මන්ත්‍රීන් 29 කි.

31. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා තුනක් යටතේ දැක්විය හැකිය. එම තේමා 3 නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
1) ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ජල සම්පාදනය
2) මහජන සෞඛ්‍ය, වැසිකිළි ඉදිකිරීම්, මහජන වෙළෙඳපළ
3) පොදු උපයෝගිතා සේවා, ඉදිකිරීම, ජලසම්පාදනය
4) පොදු මංමාවත්, මහජන සෞඛ්‍යය. පොදු උපයෝගිතා සේවා

32. පුරවැසියා කෙරෙහි බලපාන ආණ්ඩුවේ විවිධ ස්ථරවලට අදාළ විවිධ වගකීම් හා වගවීම් ඇත. අනුපිළිවෙලින් වගකීම් හා වගවීම් යනුවෙන් අදහස් වන්නේ,
1) පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඒවා ඉටුකිරීම සම්බන්ධයෙන් වූ බැඳීමයි.
2) පොදු දේපළ පවත්වා ගෙන යාම හා ඒවා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ බැඳීමයි.
3) තමාට පැවරෙන කාර්යය හොඳින් ඉටුකිරීම හා එය ඉටුකිරීම සම්බන්ධයෙන් වූ බැඳීමයි.
4) ජාතික අභිමානය, ජාතික උරුම රැක ගැනීම හා එය ඉටුකිරීම සම්බන්ධයෙන් වූ බැඳීමයි.

33. ලෝක සාමය සුරක්ෂිත කිරීම, ජාතීන් අතර සහයෝගය වර්ධනය කිරීම, මානව හිමිකම් සුරැකීම ආදී අවශ්‍යතා කෙරෙහි ලෝක ජනතාවගේ මෙන්ම ලෝක නායකයන්ගේ ද අවධානය යොමු වීමට බලපෑ ආසන්නතම ඛේදජනක සිදුවීම් දෙකක් ඇත. එම සිදුවීම් දෙක වන්නේ,
1) රුසියානු විප්ලවය - දෙවන ලෝක යුද්ධය
2) පළමුවන ලෝක යුද්ධය - දෙවන ලෝක යුද්ධය
3) කාර්මික විප්ලවය - රුසියානු විප්ලවය
4) හරිත විප්ලවය - පළමුවන ලෝක යුද්ධය

34. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට අයත් නීතිමය ලේඛන ගණන වන්නේ,
1) 4 කි.
2) 5 කි.
3) 6 කි.
4) 7 කි.

35. ''ජීවියෙක් වටා ඇති භෞතික රසායනික හා ජෛවීය තත්ත්වයන් පරිසරයයි.'' යනුවෙන් පැවසූ චින්තකයා.
1) ගැනේ ජෝන්ස්
2) ජෝන් ගැල්ටුං
3) රතු ඉන්දියානු නායක සියැටල්
4) මයිකල් ඇල්බි

36. රටේ සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන සංවර්ධන මිනුම් වර්ග දෙකක් පවතින අතර ඒවාට අදාළ මිනුම් ඒකක කිහිපයක් පහත දැක්වේ.
A. දළ ජාතික නිෂ්පාදිතය
B. භෞතික ජීවන තත්ත්ව දර්ශකය
C. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
D. මානව දරිද්‍රතා දර්ශකය

ඉහත මිනුම් ඒකක අතරින් නූතන මිනුම් ඒකකයන් වන්නේ,
1) A හා B ය.
2) B හා C ය.
3) C හා D ය.
4) B හා D ය.

37. තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී වැදගත් වන සමාජීය අවශ්‍යතා වන්නේ,
A. සමාජ සහභාගීත්වය
B. වෙළෙඳපොළ පුළුල් වීම නිසා ඇති වන තරග පාලනය
C. සාධාරණත්වය ඉටුකර ගැනීම
D. මූලික මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම
1) ABC ය.
2) BCD ය.
3) ACD ය.
4) AB D ය.

38.සාර්ක් සාමාජික රටවල් අතර ඇති කර ගෙන ඇති වෙළෙඳ ගිවිසුමක් වන්නේ,

1) ICTA ය. 2) NEFTA ය. 3) NATO ය. 4) SAPTA ය.

39. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ සිටින ස්ථාවර සාමාජික රටවල් 3 ක් ඇතුළත් පිළිතුර වන්නේ,

A. චීනය B. ඇමරිකා එක්සත් ජනපදය
C. ජපානය D. බ්‍රිතාන්‍යය

1) ABC ය. 2) BCD ය. 3) ABD ය. 4) ACD ය.

40. ජාත්‍යන්තර වෙළෙඳාම තුළ භාවිත වන ප්‍රබල මුදල් වර්ග 3 ක් ඇතුළත් පිළිතුර වන්නේ,

A. ඉන්දියානු රුපියල් B. යූරෝ
C. ජපන් යෙන් D. ඇමෙරිකානු ඩොලර්

1) ABC ය. 2) BCD ය. 3) CDA ය. 4) ABD ය.

---

සැලකිය යුතුයි.

## කොටස-II

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. ජාතික රාජ්‍ය පිළිබඳ අදහස් දක්වමින් එම සංකල්පය ශක්තිමත් තත්ත්වයකට ගෙන ඒමට දායක වූ දේශපාලන චින්තකයන් දෙදෙනෙක් නම් කරන්න.

ii. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති අතර එහි දී හමුවන ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න.

iii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට වෙළෙඳාම සඳහා විවිධ ජාතීන්ගේ පැමිණීම හේතු වී ඇත. එසේ වෙළෙඳාම සඳහා ලංකාවට පැමිණි ජාතිකයන් දෙපිරිසක් නම් කරන්න.

iv. මූලික ආර්ථික ප්‍රශ්නයක් වන " කෙසේ නිෂ්පාදනය කරන්නේද යන" ආර්ථික ප්‍රශ්නයේ දී සෑම රටකටම මුහුණ පාන්නට සිදුවන අතුරු ප්‍රශ්න දෙක ලියන්න.

v. ගැටුම් වර්ග පුළුල් ලෙස ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ අධ්‍යයනය කළ හැකි අතර එම ක්ෂේත්‍ර දෙක නම් කරන්න.

vi. 1973 යුක්තිය පසිඳලීමේ පනතට අනුව ශ්‍රී ලංකාවේ ඉහළම උසාවිය ලෙස පිළිගත් අධිකරණයට අමතරව ආරම්භ කරන ලද වෙනත් අධිකරණ දෙකක් නම් කරන්න.

vii. ප්‍රජා සංවර්ධනය විධිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විවිධ කාලවල විවිධ පළාත් පාලන ආයතන පිහිටු වනු ලැබීය. ඒ අතරින් 1865 වර්ෂයේ දී හා 1987 වර්ෂයේ දී පිහිටු වන ලද පළාත් පාලන ආයතන දෙක අනුපිළිවෙලින් ලියන්න.

viii. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අදාළ මූලික අයිතිවාසිකම් පළමුවෙන් ඇතුලත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග ඇතුලත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් කරන්න.

ix. පෘථිවි ගෝලයේ ස්වභාවික තුලනය සඳහා බලපාන ඇතැම් ස්වාභාවික සංසිද්ධීන් මගින් ද පාරිසරික ගැටලු ඇති වේ. ලංකාවේ දක්නට එවැනි ස්වභාවික සංසිද්ධීන් දෙකක් නම් කරන්න.

x. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ බලවත් රාජ්‍ය විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරන අතර එවැනි බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ල. 10 x 2 = 20)

02. ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ජන සමාජය තුළ ස්ථාපිත වීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සාර්ථකත්වයට හේතුවේ.

i. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතුවිය යුතු වැදගත් ගුණාංග දෙකක් ලියන්න. (ල. 02)

ii. රටකට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්වාගෙන යාමේ වැදගත්කම කවරේද? කරුණු 3 ක් ලියන්න. (ල. 03)

iii. ආණ්ඩුවක් විසින් තම පාලන කටයුතු පවත්වා ගෙන යාමේ දී ජන සමාජයට ඉටු කළ යුතු වගකීම් 2 ක් ලියා එම වගකීම් අතරින් එක් වගකීමක් වර්තමාන ආණ්ඩුව මගින් ඉටුකරන ආකාරය හා එය රටේ සංවර්ධනයට බලපා ඇති අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2+3=5)

03. මිනිස් වුවමනා ඉටුකර ගැනීමේ දී විවිධ භාණ්ඩ හා සේවා යොදා ගනු ලැබේ.

i. අප භාවිතා කරන භාණ්ඩ ප්‍රධාන කොටස් 2 කි. ඒවා නම් කරන්න. (ල. 02)

ii. නිෂ්පාදන සාධක අතරින් 3 ක් ලියා ඒවාට සිදුකරන ගෙවීම් හඳුන්වන ආකාර 3 ද ලියන්න.(ල. 03)

iii. ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසි 2 ක් ලියා ඉන් එකක් පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් වර්තමාන තොරතුරු ඇසුරින් ලියන්න. (ල. 05)

04. ගැටුම්කාරී චර්යා සහිත පුද්ගලයින් නිසා පවුල තුළත්, පවුල අතරත්, සමාජය තුළ හා ආයතන තුළ ද ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වේ.

i. පුද්ගල මනසේ සාමය ඇති කර ගැනීමට ඔබ විසින් අනුගමනය කරන ක්‍රමවේද 2 ක් ලියන්න. (ල. 02)

ii. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඇඳ නම් කරන්න. (ල. 03)

iii. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 2 ක් ලියා ඉන් එක් ක්‍රමයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.(ල. 2+3=5)

05. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ විකාශය රාජාණ්ඩු සමය දක්වා ම විහි දී ඇත.

i. වර්තමාන අධිකරණ පද්ධතියට අමතරව ශ්‍රී ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින් අධිකරණ බලතල සහිත විනිශ්චය අධිකාරී හා ආයතන පිහිටුවා ඇත. ඒවා අතරින් 2 ක් නම් කරන්න. (ල. 02)

ii. ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහළම තලයේ සිටින ප්‍රධාන භූමිකා 3 නම් කරන්න. (ල. 03)

iii. නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණ 2 ක් ලියා ඉන් එකක ඇති වර්තමාන ප්‍රායෝගික තත්ත්වය කෙබඳු දැයි ශ්‍රී ලංකාව ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

04. ගැටුම්කාරී චර්යා සහිත පුද්ගලයින් නිසා පවුල තුළත්, පවුල අතරත්, සමාජය තුළ හා ආයතන තුළ ද ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වේ.

i. පුද්ගල මනසේ සාමය ඇති කර ගැනීමට ඔබ විසින් අනුගමනය කරන ක්‍රමවේද 2 ක් ලියන්න. (ල. 02)

ii. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඇඳ නම් කරන්න. (ල. 03)

iii. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 2 ක් ලියා ඉන් එක් ක්‍රමයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.(ල. 2+3=5)

05. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ විකාශය රාජාණ්ඩු සමය දක්වා ම විහි දී ඇත.

i. වර්තමාන අධිකරණ පද්ධතියට අමතරව ශ්‍රී ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින් අධිකරණ බලතල සහිත විනිශ්චය අධිකාරී හා ආයතන පිහිටුවා ඇත. ඒවා අතරින් 2 ක් නම් කරන්න. (ල. 02)

ii. ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහළම තලයේ සිටින ප්‍රධාන භූමිකා 3 නම් කරන්න. (ල. 03)

iii. නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණ 2 ක් ලියා ඉන් එකක ඇති වර්තමාන ප්‍රායෝගික තත්ත්වය කෙබඳු දැයි ශ්‍රී ලංකාව ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

07. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත් වීමෙන් පසු පාලන කටයුතුවල ඇති වූ වැදගත් වෙනස් වීම් රාශියක් ඇත.

i. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළින් හඳුන්වා දෙන ලද ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවට අයත් ප්‍රධාන මණ්ඩල 2 නම් කරන්න. (ල. 02)

ii. 1972 ශ්‍රී ලංකා පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රට තුළ ඇති කළ වෙනස්කම් 3 ක් ලියන්න. (ල. 03)

iii. පළාත් පාලන ආයතන අතරින් 2 ක් නම් කර ඉන් එකක සංයුතිය හා බලතල පිළිබඳව විස්තරයක් කරන්න. (ල. 05)

07. පරිසරය යනු ජීවී අජීවී සංරචක සංකලනයකි.

i. පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක හතර අතරින් 2 ක් නම් කරන්න. (ල. 02)

ii. මිනිස් ක්‍රියාකාරකම් නිසා උද්ගත වී ඇති පාරිසරික ගැටලු 3 ක් ලියන්න. (ල. 03)

iii. රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ අතරින් 2 ක් ලියා සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ලංකාව වර්තමානයේ දී මුහුණ පා ඇති දිළිඳු බවේ විෂම චක්‍රයෙන් මිදීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ඔබේ යෝජනාවක් කෙටියෙන් පහදන්න. (ල. 05)

( දිළිඳු බවේ විෂම චක්‍රය තුළ ඇති එක් අවස්ථාවක් පදනම් කරගෙන ඔබේ යෝජනාව ඉදිරිපත් කරන්න.)

* * *

# තෙවන වාර පරීක්ෂණය - 2019

# පුරවැසි අධ්‍යාපනය

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### I - කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 02. | 2 | 03. | 4 | 04. | 1 | 05. | 4 | 06. | 3 | 07. | 2 |
| 08. | 1 | 09. | 2 | 10. | 3 | 11. | 2 | 12. | 3 | 13. | 4 | 14. | 3 |
| 15. | 2 | 16. | 1 | 17. | 2 | 18. | 3 | 19. | 4 | 20. | 3 | 21. | 2 |
| 22. | 1 | 23. | 2 | 24. | 3 | 25. | 4 | 26. | 3 | 27. | 2 | 28. | 1 |
| 29. | 2 | 30. | 3 | 31. | 4 | 32. | 3 | 33. | 2 | 34. | 3 | 35. | 4 |
| 36. | 4 | 37. | 3 | 38. | 4 | 39. | 3 | 40. | 2 | | | | |

### II - කොටස

01. i. නිකොලායි, මැකියාවෙලි, ජීන් බොඩැන්, තෝමස් හොබ්ස්

ii. අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී

iii. අරාබි ජාතිකයන්, චීන ජාතිකයන්, ඉන්දියානුවන්, යුරෝපා ජාතීන්

iv. 1. යොදා ගන්නා ශිල්පීය ක්‍රමය කුමක් ද?
2. නිෂ්පාදනය කරනු ලබන්නේ කුමන අංශයෙන් ද?

v. අභ්‍යන්තර ගැටුම් / අන්තර්ජාතික ගැටුම්

vi. මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය

vii. මහනගර සභා, පළාත් සභා

viii. 1. 1972 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 2. 1978 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ
1. ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 2. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ix. භූමිකම්පා, නායයෑම්, ලැව් ගිනි, , ජල ගැලීම්, නියඟ, සුනාමි, සුළි කුණාටු

x. අන්තර්ජාතික වෙළෙඳාම/ණය හා ආධාර දීම/ආර්ථික සංවර්ධනය/ආරක්ෂක ක්ෂේත්‍රය/රැකියා සැපයීම

02. i. සාකච්ඡා මගින් තීරණවලට එළඹීම/විරුද්ධ මත ඉවසීම/බහුතර මතයට ගරු කිරීම/සහයෝගයෙන් කටයුතු කිරීම /මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම/නීති ගරුක වීම/අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම යන කරුණු අතරින් 2 ක්

ii. සමාන අයිතිවාසිකම් හිමි වීම/පුද්ගල හැකියා හා දක්ෂතා සංවර්ධනය / පුරවැසියන්ට පාලනයට සහභාගී වීමට අවස්ථාව උදා වීම/මානව සංවර්ධනයට ප්‍රමුඛතාව හිමි වීම/සාමකාමී සමාජයක් ගොඩනැගීමට පදනම වැටීම/ සමාජ සුබසාධනය යන කරුණු අතරින් 3 ක්

iii. නීතිය හා සාමය ආරක්ෂා කිරීම/සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම/ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම/නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීමට ඉඩ සැලසීම/රටේ සම්පත් සාධාරණව බෙදී යන පරිදි කටයුතු කිරීම/සමාජ සුරක්ෂිතභාවය හා සුබසාධනය ඇති කිරීම/පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම යන කරුණු අතරින් දෙකක් හෝ ඊට සමාන අදහස් 2 ක් ලියා අද රට තුළ පවතින තත්ත්වය පිළිබඳ තොරතුරු විධිමත්ව හා තාර්කිකව මෙන්ම සවිස්තරාත්මකව ලියා ඇත්නම් ලකුණු 3 ම ලබා දෙන්න

03. i. ආර්ථික භාණ්ඩ / ආර්ථික නොවන භාණ්ඩ (ල. 02)

ii. භූමිය - බදු කුලිය / ශ්‍රමය - වැටුප / ප්‍රාග්ධනය - පොලිය / ව්‍යවසායකත්වය - ලාභ හෙවත් ලාභය

iii. සේවා නියුක්තිය ඉහළ යාම/ විදේශ විනිමය ඉපයුම් ඉහළ යාම/ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම/ ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම/ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම/ලෝක අර්බුදවලට මුහුණ දීමට හැකි වීම/යටිතල පහසුකම් වර්ධනය වීම/නව රැකියා වෙළෙඳපොළ පුළුල් වීම/ජාත්‍යන්තරය තුළ කැපී පෙනෙන තත්ත්වයක් ලබා ගැනීම/සාමය පවත්වා ගෙන යාමට හැකි වීම
යන කරුණු අතරින් 2 ක් ලියා ඉන් එකක් පිළිබඳව කාලීන තොරතුරු ඇතුළත් කරන ලද පැහැදිලි කිරීමකට (ල. 03)

04. i. ආගමික වතාවත් කෙරෙහි යොමු වීම/මනෝ විද්‍යාත්මක අභ්‍යාස කිරීම/උපදේශනය මගින්/ස්වභාවික පරිසරය නිරීක්ෂණය මගින් යනාදී කරුණු 2 ක්

ii.




iii. සාකච්ඡා කිරීම /සම්මන්ත්‍රණය හා කේවල් කිරීම/මැදිහත්කරණය/සමථකරණය/බේරුම් කිරීම/විමසීම/ එකඟතාවයක් ගොඩනැගීම/උපදේශනය
මෙම ගැටුම් නිරාකරණ ක්‍රම අතරින් 2 ක් ලියා ඉන් එකක් විස්තර කර තිබිය යුතුය. විස්තර කිරීමේ දී එම ක්‍රමය යොදා ගත හැකි අවස්ථා නිවැරදිව සඳහන් විය යුතුය. එමෙන්ම එම ක්‍රියාවලියේ ලක්ෂණ හෝ කිහිපයක් ලියා ඇත්නම් ලකුණු 3 ම ලබා දිය හැකිය.

06. i. කම්කරු විනිශ්චය සභාව/කාර්මික උසාවිය/ගෙවල් කුලී මණ්ඩලය/සමථ මණ්ඩලය යන කරුණු අතරින් 2 ක්
ii. අධිකරණ අමාත්‍යතුමා/අග්‍ර විනිශ්චයකාරතුමා/නීතිපති තුමා
iii. ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම/නීතිය පිළිබඳව සෑම පුරවැසියෙකුටම අවබෝධයක් තිබීම/සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම/පුද්ගලයන්ගේ තාරාතිරම, රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කර ගෙන ක්‍රියාත්මක නොවීම/නීතිය ඉදිරියේ සෑම දෙනාම සමාන පුද්ගලයන් සේ සැලකීම/විනිශ්චයකාර වරුන්ට තම තීන්දු ගැනීමේ දී බලපෑම් සිදු නොවීම.
ඉහත කරුණු අතරින් 2 ක් ලියා ඉන් එකක් පිළිබඳව නිවැරදි පැහැදිලි කිරීමක් තිබිය යුතුය. එහිදී තෝරාගත් කරුණු, කොතරම් සමාජයට වැදගත් යන්නත් වර්තමානයේ දී එහි ප්‍රායෝගික තත්ත්වයේ ඇති යහපත් හෝ අයහපත් බවත් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු 3 පිරිනැමීම උචිතය.

07. i. මහජන මන්ත්‍රී මණ්ඩලය (නියෝජන මන්ත්‍රී මණ්ඩලය) /සෙනෙට් සභාව (උත්තර මන්ත්‍රී මණ්ඩලය)
ii. 1972 - ඩොමීනියන් තත්ත්වය අහෝසි කර ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම/ඒක මණ්ඩල ව්‍යවස්ථාදායක ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම/අග්‍රාණ්ඩුකාර ධූරය අහෝසි කර ජනාධිපති ධූරයක් ඇති කිරීම/ ශ්‍රී ලංකාවේ අවසානම හා ඉහළම උසාවිය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගැනීම/ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම/රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය, රාජ්‍ය සේවා විනය මණ්ඩලය සහ අධිකරණ සේවා උපදේශක මණ්ඩලය, අධිකරණ සේවා විනය මණ්ඩලය පිහිටු වීම/මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ප්‍රථමවරට ඇතුළත් කිරීම
මෙම කරුණු අතරින් 3 ක් ලියා තිබිය යුතුය
iii. <u>මහනගර සභා, නගරසභා, ප්‍රාදේශීය සභා:</u>
1947 අංක 16 දරණ මහනගර සභා ආඥා පනත මගින් පිහිටුවා ඇත. මෙහි නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයන්ගෙන් සමන්විතය. නාගරික කලාපයට ජලය සැපයීම, විදුලි ආලෝකය සැපයීම, නගර අලංකරණය, කුණුකසල ඉවත් කිරීම, අලුත් මාර්ග ඉදිකිරීම, නිවාස යෝජනා ක්‍රම සකස් කිරීම, පුස්තකාල පහසුකම් ඇති කිරීම, ප්‍රජාශාලා ඇති කිරීම, ක්‍රීඩාපිටි, ක්‍රීඩාගාර පවත්වා ගෙන යාම, පොදු වැසිකිළි - කැසිකිළි පවත්වා ගෙන යාම, විනෝද ස්ථාන පාලනය කිරීම, කිරුම් මිනුම් කටයුතු පාලනය, සුළු වාරිමාර්ග නඩත්තුව, පොදු ළිං, පොදු නාන ස්ථාන පවත්වා ගෙන යාම යනාදී බලතල අතරින් 2 ක් වත් ඇතුළත් විය යුතු අතර, එහි සංයුතිය ද සඳහන් විය යුතුය.

<u>නගර සභා:</u>
1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත යටතේ නගර සභා පිහිටුවා ඇත. නගර සභාවක සභාපති, උප සභාපති හා සභිකයන් ඇත. මහනගර සභාවලට පැවරී ඇති ඉහත බලතල නගර සභාවලට ද හිමි වේ.

<u>ප්‍රදේශීය සභාව:</u>
1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පිහිටුවා ඇත. මෙහිද සභාපති, උපසභාපති හා සභිකයන් ඇත. මහනගර සභා සතු බලතල හා කාර්යයන් බොහොමයක් ප්‍රාදේශීය සභාවලට ද හිමි වේ.

08. i. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්/ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්
ii. කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්/පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්/ අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය/ ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය/ සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය /සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය
iii. ළමයාගේ පැවැත්ම සහ සංවර්ධනය/පවුල් සම්බන්ධතා ආරක්ෂා කිරීම/පවුල් පරිසරය අහිමි වූ දරුවන්ට ආරක්ෂාව සැලසීම/සමාජ සුරක්ෂිතතාව සැලසීම/ළමයාගේ උපරිම යහපත සැලසෙන අයුරින් නීති ක්‍රියාත්මක කිරීම/සන්නද්ධ අරගලවලට යොදවා නොගැනීම/අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම
මේ අතරින් කරුණු 2 ක් දක්වා වර්තමාන සමාජය තුළ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග එමෙන්ම ළමා පරපුර මුහුණ දෙන අභියෝග ආදිය ලියා තිබිය යුතුයි.

09. i. අජෛවී සංරචක/ජෛව සංරචක/සමාජ පරිසරය/ස්වභාවික පරිසරය
ii. ගෝලීය උණුසුම වැඩි වීම, කාලගුණ රටාවේ තදබල වෙනස්වීම් හට ගැනීම , ජෛව විවිධත්වය, දූෂණය වීම, පසේ සරුභාවය නැති වීම, අම්ල වැසි ඇති වීම, ඕසෝන් ස්ථරය විනාශ වීම, වාතය හා ජලය දූෂණය වීම, කාන්තාරකරණය, ලවණීකරණය, ව්‍යවසන හා වසංගත ව්‍යාප්තිය, හිම දිය වීම, සාගර ජල මට්ටම ඉහළ යාම යනාදී කරුණු හෝ වෙනත් නිවැරදි පිළිතුරු 3 ක් හෝ ඇත්නම් ලකුණු 3 යි
iii. ගැටලු අවබෝධ වේ/ ගැටලුවලට විසඳුම් සෙවීම/ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේ දී වැදගත්ය/රටවල් සමඟ සැසඳීමට හැකි වේ/ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනසකම් ඇති කිරීමට හැකි වේ./සංවර්ධන විෂමතා හඳුනා ගනියි.
යන කරුණු අතරින් 2 ක් ලිවිය යුතුය. එමෙන්ම දිළිඳුබවේ විෂම චක්‍රයට අයත් අවස්ථා පහෙන් එක් අවස්ථාවක් තෝරා ගෙන එය වෙනස් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් පිළිබඳව අදහස් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.